13/03/2012 - ලංකාදීප

**ජාත්‍යන්තරයට නිවැරදිව මුහුණදීම - මිලින්ද මොරගොඩ**

එක්තරා අර්බුදකාරී අවස්ථාවක එවකට සිටි ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා කැබිනට් මණ්ඩලයේ අදහස් විමසා සිටියේය. ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කෙසේ ද යන පැනයට අමාත්‍යවරයෙකු උත්තර දී ඇත්තේ ''නැව බේරාගන්න නම් ගල බේරගන්න වෙයි.'' යැයි කියමින්ය. ගැටලුවකට උත්තරය ඇත්තේ ගැටලුව සමගය. උත්තරයට කලින් ගැටලුව විශ්ලේශනය කළ යුතුය. නොයෙක් පැති විමසා බැලිය හැකිය. අදහස් ඇත. මතගැටුම් ඉදිරිපත් වෙයි. නමුත් ගල් පර්වතය බේරා ගැනීමෙන් විනා නැව බේරාගැනීමට නොහැකිය. ගල් පර්වතයක හැපීමෙන් විනාශ වන්නේ ගල පමණක් නොවේ. නැව ද වැනසෙයි. දක්ෂ කපිතාන්වරයෙකු මහා සාගරයේ දී විය හැකි විනාශයක තරම හඳුනාගෙන නැව පැදවිය යුතුය. එයට වෙනස් විසඳුමක් නැත.

ශ්‍රී ලංකාව ජගත් ප්‍රජාවගේ නොඅඩු අවධානයට යළිත් ලක්ව ඇත. ජිනීවා නුවර දී රැස්වන ජාත්‍යන්තර මානව හිමිකම් සමුළුවේ සැසිවාරය සමගය. මෙහිදී ශ්‍රී ලංකාව සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කර ඇත. මෙම යෝජනාව බරපතල අසාධාරණයක් බවට මතයක් රට තුළ වැඩෙමින් පවතී. ත්‍රස්තවාදය අවසන් කරගන්නට හැකිවීම රටට ජයග්‍රහණයකි. මෙම ජයග්‍රහණය සර්ව සම්පූර්ණ වන්නේ එහි අත්දැකීම් හා වැරදීම් පාඩමක් කරගත හැකිනම් පමණකි. ජ. වි. පෙ. කැරැල්ල සමග රටට තරුණ අසහනයට හේතු සෙවීම අරමුණු කරගෙන ජනාධිපති කොමිසමක් පත් කළේය. එහි නිර්දේශ වලින් ඇතැම් කොටස් අද රට තුළ ක්‍රියාත්මකය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමන්, විද්වත් නියෝජිතයන්ගෙන් සමන්විත උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම පත් කළේය. තීරණාත්මක අවස්ථාවකට මුහුණ දීමෙන්පසු යම් පුනරුදයක් උදෙසා එයින් අත්දැකීමක් ලබා ගැනීම වැදගත්ය. අවස්ථා ගණනාවක ශ්‍රී ලාංකික සමාජයේ තරුණ උණුසුම් රුධිරය අවාසනාවන්ත ලෙස රටට අහිමිවිය. උතුරේ හා දකුණේ ගැටුම් වලින් අහිමිවූයේ දක්ෂ තරුණයන්ය. රට වෙනස් කිරීමේ උවමනාවක් ඇති පීඩනයෙන් පිරි ජන කොටසටය. මෙම අවස්ථාවලදී සිදුවූයේ කුමක්දැයි වටහා ගැනීමත්, යම් පාඩමක් ඉගෙන ගැනීමත් වැදගත්ය. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම පත්කර එහි ක්‍රියාපටිපාටිය පවත්වාගෙන යාම රටට විශේෂ කීර්තියක් අත්පත්කර දුන් අවස්ථාවකි. අලුත් යුගයකට අවතීර්ණවීමට රටට හා මහජනතාවට රටේ ඇති අවශ්‍යතාව දක්වා ජගත් ප්‍රජාවට මනා අවබෝධයක් දෙන්නට අපට අවස්ථාව තිබේ.

ශ්‍රී ලංකාව කුඩා භූමියක් හා කුඩා ආර්ථිකයක් ඇති රටකි. අතීතය දෙස බලන විට ජගත් ප්‍රජාව ඉදිරියේ ධෛර්යවත්ව අභිමානයෙන් නැගීසිටින්නට සමත්ව තිබේ. එහි ගෞරවය අත්පත් විය යුත්තේ රටේ පොදු මහජනතාවට සහ නොයෙකුත් බාධක මැද රට ඉදිරියට ගෙන ගිය නායකයන්ටය. ආක්‍රමණ තිබිණ. යටත්ව සිටි යුගයක් ද විය. පසුව නිදහස ලැබිය. දැන් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පවතී. අද මුහුණ දී ඇති අභියෝග බැරෑරුම්ය. එල්ලවන්නේ කොතැනකින්දැයි වටහාගැනීම පහසු නැත. මතුපිටට වඩා අභ්‍යන්තරය සාහසිකය. ශ්‍රී ලංකාව මැදි ආර්ථික දියුණුවක් ඇති රටක් බවට පත්ව ඇති හෙයින් ආර්ථික තරඟකාරීත්වය ආයෝජන හා සංවර්ධන ණය ගැනීමේ දී ද ජාත්‍යන්තර ප්‍රතිරූපය වැදගත් වෙයි. බාධක මැද අනන්‍යතාවය ආරක්ෂා කරගනිමින් දක්ෂ ලෙස ලෝකයේ නොයෙකුත් රටවල් සමග තරගකරන්නට මෙතෙක් අප සමත්ව ඇත. ඉදිරි ගමන සඳහා ජාත්‍යන්තරය හමුවේ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය සම්බන්ධයෙන් ඉතා වැදගත් වන්නේ විදේශ සම්බන්ධතා හා එහි උපායශීලී බවයි.

ජගත් ප්‍රජාව සමග පවත්වන සම්බන්ධතා කෙරෙහි රටට විශාල ඉතිහාසයක් තිබේ. ඉන්දියාව, චීනය ඇතුලු පෙරදිග රටවල් සමග පැවති වෙළඳ හා ධර්මදූත සම්බන්ධතා ඒ අතරින් ප්‍රමුඛය. අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය වෙළඳ නගර වශයෙන් පැවතුන බවට සාක්ෂි හමුවෙයි. නැගෙනහිර ප්‍රදේශයේ ස්වභාවික වරාය මගින් රට තුළට පැමිණ ඇති වෙළඳුන් ලාංකික සමාජය සමග ගනු දෙනු කර තිබේ. සම්පත් හුවමාරු කරගෙන ඇත. වෙළඳාම සමග ආක්‍රමණ ද සිදුව ඇත. එහිදී ශක්තිය, ධෛර්යයට අමතරව උපාය පාවිච්චි කරන ලද බවට සාක්ෂි ඇත. බාහිර බලවේග හා ඔවුන්ගේ ආකල්ප හඳුනාගෙන සාර්ථකව මුහුණ දෙන්නට හැකියාවක් පාලනය කළ රජවරුන් සතුව තිබී ඇත. පෘතුගීසීන් පැමිණි විට ගිරි දුර්ග මැදින් දීර්ඝ ගමනකින් රජු හමුවට ගෙන යාමත්, දීර්ඝ කාලයක් සටන් කළත් සම්පූර්ණයෙන්ම ලංකාව යටත් කරගන්නට පහසුනොවීමත් පෙන්නුම්කරන්නේ උපායශීලී දක්ෂතාවයයි.

පෘතුගීසීන් යටපත් කරන්නට ලන්දේසින් ගේ සහාය ලබාගෙන තිබේ. එයින් තමන්ට නැති ශක්තිය උපයා ගෙන ඇත. ලන්දේසීන්ගේ බලය පාලනය කරන්නට කෙටි කාලයකට ප්‍රංශයේ හා පසුව ඉංග්‍රීසීන්ගේ සහාය ලබා ගෙන ඇත. මෙවැනි උපාය වෙනුවෙන් දූත මෙහෙවරක යෙදී ඇත්තේ මුස්ලිම් වෙළඳ ප්‍රජාව බව ද ඉතිහාසය අධ්‍යයනය කරන විට පෙනේ. ලංකාවේ රජවරුන් විදේශ බලවේග පාලනයට යෙදූ උපක්‍රම හා උපායශීලීබව මෙයින් පැහැදිලිය. රට යටත්කරගන්නට බටහිර අධිරාජ්‍යවාදීන්ට හැකිවූයේ මෙරට සංස්කෘතික ලක්ෂණ හා අනන්‍යතාව මනාව හඳාරා ඒවා බරපතල ලෙස විනාශ කිරීමෙන් පසුවය. ජනතාව එකිනෙකා කෙරෙහි බිඳවීය. ගරු නාම හා තනතුරු දී තම පාර්ශවයට එකතු කර ගත්තේය. වැව විනාශ කළේය. පන්සල හා සමාජය අතර තිබුණ බැඳීම පලූදු කළේය. බටහිර සිරිත්, ආගම් හා සම්ප්‍රදායයන් මෙරට සමාජයට කාන්දු කළේය. එවැනි දෑ ඉහළින් පිළිගන්නා මානසිකත්වයක් ඇතිකළේය. පරම්පරා ගණනකට පසු අද පවා රටට ගැලපෙන පිරිසිදු අනන්‍යතාවක් සොයායන බව පෙනෙන්නේ මෙම පරිහානියට මුහුණ දීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

රටට නිදහස ලබා ගැනීමෙන් පසු ගතවූ මුල් කාලයේ අමෙරිකාව හා සෝවියට් දේශය යන බලවත් රාජ්‍ය අතර සීතල යුද්ධයක් පැවතින. බලවත් රාජ්‍ය සමග නිසි සම්බන්ධතා පවත්වා ගනිමින් තම විදේශ ප්‍රතිපත්තිය සමබරව පවත්වාගෙන යන්නට ශ්‍රී ලංකාවට හැකි විය. දෙවන ලෝක යුද්ධයෙන් පසු බල තුලනය ක්‍රමයෙන් වෙනත් මුහුණුවරක් ගත්තේය. යුද්ධයෙන් බැට කෑ ජපානය යුධ වන්දි ගෙවිය යුතු රටක් වශයෙන් කොන්කළේය. එහිදී වෙනස් මතයක් ඉදිරිපත් කළේ ශ්‍රී ලංකාව පමණකි. එම අවස්ථාවේ දී එවකට ජනාධිපතිව සිටි ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා කළ ප්‍රකාශය ලෝක අවධානය වෙනස් කරන්නට සමත්විය. ජයවර්ධන මහතා අමෙරිකාවට නැඹුරු උපායකින් හා බුද්ධ දර්ශනය ගැබ් වූ සංකල්පයකින් ජපානය හා ශ්‍රී ලංකාව සදාකාලික මිතුරෙකු බවට පත් කරගත්තේය. නමුත් සමාජයට ඔහු යැංකි ඩිකීය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සමයේ 71 කැරැල්ල ට උතුරු කොරියාවේ සම්බන්ධයක් තිබුණ බවට චෝදනා නැගින. පසුව රට, නොබැඳි ජාතියක් වශයෙන් පෙන්නුම් කළාය. ජාත්‍යන්තර බලවේග ඉදිරියේ මෙරට අනන්‍යතාව ආරක්ෂා කළ ගිය වෙනත් උපායශීලී පිළිවෙතකි. බලවත් රාජ්‍ය හමුවේ අභියෝගයක් විය නොහැකි නමුත් කුඩා රටකට උපායදැන දූරදක්නා නුවණින් ක්‍රියාකිරීමෙන් ගෞරවයත් අවස්ථාවත් දිනා ගත හැකිය. විදේශ සම්බන්ධතා වලදී දුරින් සිටින අමෙරිකාව සේ ම ලඟින් සිටින ඉන්දියාව වැදගත්ය. ඉන්දු ශ්‍රී ලංකා සබඳතා පලූදු වූ අවස්ථා වල රටට බරපතල තත්ත්ව ඇතිවිය. එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය වැඩුණේ ඉන්දියන් ආශීර්වාදය ඇතිව බව රහසක් නොවේ. දෙරට අතර ශක්තිමත් සම්බන්ධතා තිබුණේ නම් ත්‍රස්තවාදීන්ට පුහුණුව හා ලැබෙන්නේ නැත. එයට ගෙවූ වන්දිය අවුරුදු තිහක යුද්ධයකි. දෙරටේ ම රාජ්‍ය නායකයෝ එහි බිල්ලක් වූහ. එය ද පාඩමකි. ආර්ථික දේශපාලන වෙනස්කම් ඉදිරියේ මෙරට රාජ්‍ය නායකයන් නොයෙකුත් තීරණ ගෙන ඇත. අභියෝග, තර්ජන හා මර්දන ඉදිරියේ අවශ්‍ය විටෙක නැමෙමින් හා තවත් අවස්ථාවක පියවරක් පිටුපසට තබමින් ක්‍රියාකිරීම කැපීපෙනෙයි.

1971 කැරැල්ල, 83 ජූලි කලබල, 1987 දෙවැනි කැරැල්ල හා එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය ශ්‍රී ලංකාවේ කීර්ති නාමය අභියෝගයට ලක්වූ බැරෑරුම් අවස්ථාය. ජාත්‍යන්තර සමාජය හමුවේ යථාර්ථය දක්වන්නට රාජ්‍ය පාලකයන්ට හැකිවිය. විදේශ මිතුරන්ගෙන් උදව් පැතීම පහසු නැත. මානව හිමිකම්, මාධ්‍ය නිදහස, පරිසර ප්‍රශ්න හා නොයෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ඉදිරිපත් කරමින් බලපෑම් කරන විදේශ රටවල මත සමබර කරගනිමින් අභ්‍යන්තර ප්‍රශ්න වලට මුහුණදීම බෙහෙවින් අසීරුය. නොයෙක් අභ්‍යන්තර ගැටලු හමුවේ වුවද සාර්ථකත්වයට බලපාන අන්දමට මෙරට විදේශ ප්‍රතිපත්ති සකස් කරගන්නට හැකිවී තිබේ. ආපසු හැරී බලනවිට පෙනෙන යථාර්ථය එයයි. අඩු ලුහුඬුකම්, දුර්වලතා නොතිබුණා යැයි චෝදනා කළ හැකිය. එනමුත් රටට බරපතල තත්ත්වයන්ට මුහුණ දෙන්නට සිදුවූයේ නැත. රට තුළ ඇති වූ ප්‍රශ්න පැහැදිලිව තේරුම් කර දුන් විය එය නිරාකරණය කර ගන්නට ආධාර ලැබිණ. උපදෙස් හිමිවිය. ලෝක නායකයෝ රටට හිතවත් අන්දමට ක්‍රියා කළේය.

දීර්ඝ කාලයක් යුද පරිසරයකට කොටුවී සිටි අවස්ථාවේ රටට ජාත්‍යන්තරය ඉදිරියේ තිබුණ ප්‍රතිරූපය වෙනස්ය. එය බැරෑරුම් කාලයකි. ඝාතන, විනාශය හා ජන කණ්ඩායම් අසරණවීම වැනි ප්‍රශ්න ඉදිරිපත්විය. මනුෂ්‍ය ජීවිත ගැන අවධානය යොමු කරන ලෝක බලවතුන් විවිධ පැති ඔස්සේ රටට බලපෑම් කළහ. ජනවර්ග අතර ප්‍රශ්නය හා ත්‍රස්තවාදය අතර වෙනස පැහැදිලි කර දී රටට හිතකර අවසානයක් කරා ගමන්කරන්නට ආණ්ඩු ගණනාවක, විවිධ තරාතිරමේ නායකයින් රැසකට වෙහෙසෙන්නට සිදු විය. රාජ්‍ය නායකයෝ ජීවිත පරදුවට තබා ක්‍රියා කළහ.

දේශපාලන හා ආගමික නායකයෝ ගණනාවක් ජීවිත පූජා කළහ. සාකච්ඡා මගින් විසඳා ගන්නට දරන ලද උත්සාහ ව්‍යවර්ථ විය. ත්‍රස්තවාදය තුරන් කරන්නට මානුෂික මෙහෙයුමක් අරඹන ලද්දේ සියලු කැපකිරීම් අවසානයේ දීය. රටට, නායකයන්ට වෙනත් විකල්පයක් නොතිබිණ. උතුරේ හා හා දකුණේ මහ ජනතාව එයට එකග විය. මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමා ගේ නායකත්වයෙන් ආරක්ෂක අංශ මානුෂික මහා මෙහෙයුමක් ඇරඹීය. මහජනතාව මහත් කැපකිරීමක් කළහ.

ත්‍රස්තවාදය පරාජය කර සාමය තහවුරු කරගැනීම කරා ගමන් කරන රට හමුවේ ඇති අභියෝග සියුම්ය. එදාට වඩා වෙනස්ය. සාමකාමී සමාජයක අවශ්‍යතා යුධ පසුබිමක දී පැවති එකකට වඩා සාධනීය එකකි. ජාත්‍යන්තර ප්‍රජාව දක්වන ආකල්ප හමුවේ දක්වන ප්‍රතිචාර සහමුලින්ම වෙනස් එකක් විය යුතුය. මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමා ජනතාව මුහුණ දුන් ත්‍රස්තවාදය මර්දනය කළ අතර එකී ප්‍රතිපලය ල`ගාකර ගැනීමට අවශ්‍ය ජාත්‍යන්තර පසුබිම සකස්කරගන්නට එදා සමත්විය. ත්‍රස්තවාදය තුරන් කරගැනීමේ ප්‍රමුඛ අභිලාශය පවතිනවිට විදේශ ප්‍රතිපත්තිය යම් යම් රටවල් සමග වචන හුවමාරු හා යම් ප්‍රමාණයක දරදඩුවීම සාධාරණ විය හැකිය. ජාත්‍යන්තර ප්‍රජාව එය තේරුම් ගත් බවට ද සැකයක් නැත. නමුත් ඒ යුගය අවසන් වීමෙන් පසු සාමකාමී යුගයේ දී නම්‍යශීලී ප්‍රවේශයක් පවත්වාගෙන යාම සුදුසුය. ත්‍රස්තවාදය තුරන් කිරීමෙන් පසු ජගත් ප්‍රජාව සමග එක්ව අලූත් ගමනකට සූදානම් බව අප පෙන්විය යුතුය. එය පහසු නැත.

අද ජීවත්වන්නේ සමාජ ගෝලීයකරණය හමුවේය. ලෝකය එකම යායකි. රටවල් වෙන්කළ භූගෝලීය මායිම් වෙනුවට සමාන අදහස් ඇති ප්‍රජාව එකතු වෙමින් තිබේ. එම බලවේග තොරතුරු තාක්ෂණය හා දියුණු සන්නිවේදනයෙන් ප්‍රයෝජන ගනී. රටක් තුළ සිදුවන දෙයක් රහසක් වන්නේ සුළුවෙලාවක් පමණකි. එයින් පසු ඒ ගැන විවිධ පැති වලින් මතවාද මතුවෙයි. මුද්‍රිත මාධ්‍යයෙන් පැතිරෙන කාලයට ඉක්මනින් සිදුවන මෙම සන්නිවේදනය සම්ප්‍රදායික සමාජයට අභියෝගයකි. එවැනි අවස්ථාවක සමාජ තුළ තනි ගමනකට ඉඩ නැත. මෑත කාලයේ මැදපෙරදිග කලාපයේ සිදුවූ ජන අරගල එය පැහැදිලි කළ අවස්ථාවකි. දීර්ඝ කාලයක් රාජ්‍ය පාලනයේ යෙදුන නායකයන් ගේ ගමන තවදුරටත් පිළිගන්නට තරුණ සමාජය සූදානම් වූයේ නැත. නායකයන්ට අභියෝග කළේ තාක්ෂණය වහල් කරගනිමින්ය. එය රැල්ලක් ලෙස පැතිර ගියේය. සමාජ ගෝලීයකරණය අනෙක් රටක පැවැත්මට මැදිහත්වන ආකාරය එයින් පැහැදිළි විය. පිළිගත් පාලනයට එරෙහිව සිදුවන මෙවැනි මහජන නැගිටීම් කුමන්ත්‍රණකාරීයැයි චෝදනා කළ හැකිය. පවතින ක්‍රමය අසාධාරණ වන විට එයට එරෙහිව මතය නැගෙන්නේ ගෝලීයකරණය වූ සමාජයේ වෙනත් කෙළවරකින්ය. සාර්ථක ලෙස එයට මුහුණ දෙන්නට හැකිවූ රටවල නායකයෝ සමාජයට වඩා ඉදිරියෙන් සිටින්නටසමත් වූහ. සිංගප්පූරුව එය සාර්ථකව කළේය. ආර්ථිකය දියුණු වන විට මධ්‍යම පන්තිය වැඩෙන අතර ඔවුනගේ ආකල්ප සිතුම් පැතුම් වෙනස් වෙන්නට පටන් ගනී. එම පිරිසට වඩා ඉහලින් සිතන්නට සමත්වන නායකයෝ සාර්ථක වී ඇත. චීනයේ ආර්ථිකය විවෘතවන විට සමාජ ක්‍රමය ද ක්‍රමයෙන් විවෘත කළේය. රුසියාවේ එය සිදුවෙමින් තිබේ. දක්ෂ නායකයින් වගකීමක් ඇති සමාජ ප්‍රතිසංස්කරණ මගින් දියුණු වන සමාජයට ඉලක්ක සැපයිය යුතුය. එවිට බාහිර සමාජ සමග සංසන්දනය හා අනවශ්‍ය ගැටලු නිරාකරණය වෙයි.

තම ප්‍රශ්න හමුවේ විදේශීය බලවේග එල්ලවන බව දැනෙන විට ඕනෑම සමාජයක් නැගී සිටියි. තම අභිමානය හා ක්‍රියාකිරීමේ හැකියාව ජාත්‍යන්තර බලවේග නිසා පාලනයවන බව පෙනෙන විට එයට එරෙහිව මහජන උද්ඝෝෂණ ඇතිවෙයි. දේශීය බලවේග එකතු වෙයි. එම බලවේග අන්තවාදය කරා ඇදී යයි. අන්තවාදය පාලනය කිරිම වගකිව යුතු රජයකට පහසු නැත. එය සාමාන්‍යයෙන් සිදුවන්නකි. විදේශ කුමන්ත්‍රණ දෙස ඇ`ගිල්ල දිගුකරන සංස්කෘතිය පොදු එකකි. එහෙත් එහි සීමාවක් ඇත. මෙයින් අවුරුදු කිහිපයකට කළින් රට තුළ ඇති ප්‍රශ්න වලට ජාත්‍යන්තර දේශපාලනයට දොස් තබා මහජනතාවගේ විරෝධය යම් පමණකට මැඩ පවත්වා ගැනීමට ඉඩ තිබුණි. බඩු මිළ වැඩි වන විට, ආර්ථිකය කඩා වැටෙන විට ජාත්‍යන්තරයට ඇ`ගල්ල දිගු කරන දේශපාලනයක් අපට තිබුණි. එහෙත් දැන් පසුවන්නේ වේගයෙන් තොරතුරු හුවමාරුවන යුගයකය. ජගත් ප්‍රජාව සමග ගනුදෙනු කිරීමේදී සූක්ෂම හා උපායශීලීවීම ඉතාම වැදගත්ය.

ශ්‍රී ලංකාව සමග සම්බන්ධකම් අත්හරින්නට සිදුවීම දැවැන්ත ආර්ථිකය ඇති රටවලට විශාල දෙයක් නොවේ. ලංකාවේ සහයෝගය හෝ මෙරටින් යැවෙන වෙළඳ භාණ්ඩ නැතිව පවතින්නට මෙම රටවලට හැකියාව තිබේ.

එහෙත් එකී රටවල ආයෝජන හා වෙළඳපොළ රහිතව සංවර්ධනය කරා යාම අපට අපහසුය. එය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා අවශ්‍යය. නැගෙනහිර රටවල ලෝක ආර්ථිකය දියුණුවෙන්නේ ආසියාව කේන්ද්‍රකරගත් නැගෙනහිර කලාපය හෙයින් බව විශේෂඥ මත ප්‍රකාශ කරයි. නමුත් බටහිර ප්‍රජාව සම්පූර්ණයෙන් අමතක කර ගමනක් නැත. ප්‍රබල රටවල් මේ යථාර්ථය දනී. චීනය ආර්ථික අතින් ඉහලින් සිටිය ද බටහිර සමග අමනාපයක් නැත. ආර්ථික වර්ධනය සමග චීනයේ ඇති අතිරික්ත විදේශ මුදල් අමරිකාවේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරයි. දේශපාලන හා එකිනෙකා අභිබවා යන්නට දරන ආරක්ෂක උපක්‍රම තුළ වුවත් ආර්ථික සබඳතා නිදහසේ වැඩෙන බවට මෙය හොඳ උදාහරණයකි. වෙනස්වෙමින් පවතින ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන ධාරාව තුළ ශ්‍රී ලංකාව ද කොටස්කරුවෙකු විය යුතුය. එය කළහැක්කේ කෙසේද? පළමුවෙන් ජාත්‍යන්තර දේශපාලනය නිවැරදිව අවබෝධකර ගත යුතුය.

මාධ්‍ය භාවිතාව හා තොරතුරු සන්නිවේදනය දියුණු මේ වකවානුවේ රටක තොරතුරු වේගයෙන් ව්‍යාප්තවන අතර ඒ අනුව ලෝක වාසීන් හා ප්‍රජා සංවිධාන පාලකයන්ට බලපෑම් කරයි. නොයෙකුත් මත අනුව සංවිධානය වූ සමාජ තිබේ. රාජ්‍ය නොවන සංවිධාන ඇත. ආර්ථිකය, දේශපාලනය, මානව හිමිකම්, මාධ්‍ය නිදහස, කාන්තාව බලසතුකිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිය වැනි මාතෘකා ඒ අතර ප්‍රධානය. එවැනි මතධාරී සංවිධාන රටකට වඩා බලවත් වන අවස්ථා ඇත. රටකට බලපෑම් කරන්නට සමත්ය. යුක්ති සහගත හා විනිවිද පෙනෙන අන්දමට ක්‍රියා කරන ලෙස ඔවුන් කරන බලකිරීම් තවත් රටකට අත්හැර දැමිය නොහැකිය. තමන් අපේක්ෂා කරන යහපත් දේ වෙනුවෙන් ධනය පරිත්‍යාග කරන්නට ලෝකයේ මිනිසුන් කැමැත්තක් දක්වති. මහජනතාව හෝ ලෝකයේ පැවැත්ම වෙනුවෙන් වෙන්කරන ධනය ආණ්ඩුවලට දෙන විට එය දූෂණ , හා අක්‍රමිකතා වලට යොමු වන බවට අදහසක් ඇත. රාජ්‍ය නොවන සංවිධාන බලවත් වී ඇත්තේ එම පදනමෙන්ය. ශ්‍රී ලංකාවට තම අභ්‍යන්තර අවස්ථා වැදගත් සේම ඒ රටවලට ඔවුන්ගේ වැසියන් හෝ සංවිධාන ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම වලට අනුව කරන අදහස් වලට ද සවන්දෙන්නට සිදුවෙයි. ජාත්‍යන්තර සමාජය සමග එකතු වී සිටින ශ්‍රී ලාංකික ''ඩයස්පෝරාව'' ද වැදගත් සාධකයකි. බටහිර රටවල් පුරා විසිරී සිටින සිංහල හා දෙමළ සංවිධාන බටහිර රටවල බලවත් මතයක් දරන අතර විශේෂයෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරව ජීවත් වන දෙවන හා තුන්වන පරම්පරාවේ දෙමළ ප්‍රජාව මෙහිදී ඉදිරියෙන් සිටී. ඔවුහු 1980 සිට රටට එපිටින් සිටිමින් ස්වකීය ජන්මභූමියේ ක්‍රියාකලාපය විවේචනය කරමින් සිටිති. එය සාධාරණ නැති බවට සැකයක් නැත. එනමුත් රට හැරයන්නට සිදුවූ වෛරය හා ආපසු පැමිණීමට ඇති අකමැත්ත පිටකරන්නේ ඩයස්පෝරාවේ ක්‍රියාකාරකම් වශයෙන්ය. කියුබානු විප්ලවය සිදුවන අවස්ථාවේ එරටින් පැන ගිය කියුබානු වැසියන් අමෙරිකාවේ ජීවත්වෙමින් කියුබාවට එරෙහිව බලවේගයක් මතුකළ අතර එම සුළු පිරිස බහුතර මතය අභිබවමින් අද දක්වා අමෙරිකානු කියුබා සබඳතා කෙරෙහි විශාල බලපෑමකි. විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයගේ බලය සුළුකොට තැකිය නොහැකි බවට එය එක් උදාහරණයක් පමණී.

ත්‍රස්තවාදය තුරන්කර රටක් වශයෙන් නැගී සිටින අවස්ථාවේ ජාත්‍යන්තර සමාජය විසින් මානව හිමිකම්, කම්කරු නීති, පරිසර ආරක්ෂාව, මාධ්‍ය අයිතිය වැනි ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග ගැන කරන බලපෑම් අපට දැනෙන්නේ බරපතල අසාධාරණයක් හැටියටය. කුරිරු ත්‍රස්තවාදයෙන් පීඩා වින්දේ රට වැසියන්ය. දරු පවුල් පිටින් මර දමන හා මරාගෙන මැරෙන ත්‍රස්තවාදයකින් රටට සිදුවූ භීෂණකාරී තත්ත්වය ජාත්‍යන්තර සමාජය තේරුම් නොගෙන ඇතැයි සමාජයට තරහක් ඇති බව පෙනේ. කුඩා රටකට මෙම භයානක පැත්ත සම්පූර්ණයෙන්ම ජගත් ප්‍රජාවට සන්නිවේදනය කරන්නට ඉඩ නොලැබිණ. නමුත්, අමරිකාව, යුරෝපය හා ඉන්දියාව තුළ අදටත් එල්.ටී.ටී.ඊ සංවිධානය තහනම් එකකි. එල්.ටී.ටී.ඊ ය සාධාරණ නොවන බව පිළි නොගන්නා නමුත් නැවත එවැන්නකට යන්නට ඉඩ නොතැබියයුතු බව ජගත් ප්‍රජාව දක්වන පණිවුඩයයි. ගැටුම් පවතින අවධියේ ඔවුන් අවධානය යොමු කළේ ගැටුම ගැන විනා මෙම සමාජ අවශ්‍යතා නොවේ. සමාජය යහපාලනයට පෙරළෙන අවස්ථාවේ උපදෙස් දෙන්නට ඉදිරිපත් වන ජගත් ප්‍රජාවගෙන් රටට ගැලපෙන දේ තෝරාගෙන අනවශ්‍ය දේ උපායශීලීව ඉවත්කිරීමට හැකි රාජ්‍යතාන්ත්‍රික භාවයක් අපට අවශ්‍යය. එය විවෘතව කළ නොහැකිය. විශ්වාසය තහවුරු වන අන්දමට හා දෙපාර්ශවයේ ගරුත්වය ආරක්ෂාවන සංවාදශීලී ව්‍යායාමයක් මගින් එයට මග පාදා ගැනීම අවශ්‍යය. ජාත්‍යන්තර ප්‍රජාව සමග කරන ගනුදෙනුව දේශීය දේශපාලන වේදිකාව සමග පටලවා ගැනීම සාධාරණ නැත. රාජ්‍යතාන්ත්‍රික අයුරින් එය පවත්වාගෙන යා යුතුය. දේශපාලන පක්ෂවල මත ජාත්‍යන්තර සබඳතා වලට මැදිහත් කරගැනීම නුසුදුසුය. ජාත්‍යන්තර සබඳතා පාවෙන අයිස් කන්දක් සේ සමාජයට පෙනීම සුදුසුය. අයිස් කන්දේ ජලයෙන් උඩ

පාවෙන කොටසට වඩා විශාල ස්ථරයක් දිය යට නොපෙනෙන අන්දමට පවතී. එම නොපෙනෙන කොටස නායකයින් අතර ඇති විශ්වාසය හා ස්ථිරසාරත්වයේ පදනමයි. රටවල් හා සංවිධාන වලට විරුද්ධව නැගෙන විවිධ චෝදනා එල්ල වන්නේ දිය මතුපිට ඇති අයිස් කන්දටයි. එහෙත් එයට යටින් ඇති ශක්තිමත් පදනම මහා බලවේගයක්ව පවතින්නේ නම් හා ගලන දිය පහර ඔස්සේ ආරක්ෂිතව සුදුසු තැන් බලා ගලායන්නේ නම් පදනමට හානියක් සිදුනොවේ. හෙන්රි කිංසින්ජර් මහතා වරක් ප්‍රකාශ කළේ ''තම ප්‍රායෝගික පැවැත්මට වැදගත් වන්නේ කුමක්ද? එය ඉටුකර ගැනීම වැදගත්'' බවයි.

සාමකාමී මාවතක ගමන් කරන ශ්‍රී ලංකාවට අද අවශ්‍යව ඇත්තේ ලෝකයේ රටවල් වලට එරෙහි යුධ පෙරමුණක් ගොඩනැගීම නොවේ. අභ්‍යන්තර ප්‍රශ්නයකට අනවශ්‍ය ලෙස ඇතුලුවන බව මහජනතාව සිතයි. ත්‍රස්තවාදය සමග පැවති යුද්ධය අභ්‍යන්තර එකකි. එය විස`දා ගැනීම රටට අයත් එකකි. සිවිල් ගැටුම් වලට මැදිහත්වීම සම්බන්ධ පළමු අත්දැකීම වාර්තා වූයේ ර්‍ුවන්ඩාවේ සිදුවීම් සමගය. එහි සිදුවූයේ බිහිසුණු ගෝත්‍රික යුද්ධයකි. එය මෙරට සිදුවූ ත්‍රස්තවාදයට කිසිසේත් සමාන කළ නොහැකිය. නමුත් ජන සංහාරයක් හමුවේ ර්‍ුවන්ඩාවට මැදිහත් වන්නට ලෝක ප්‍රජාවට අයිතියක් ඇතැයි තර්කයක් මතු විය. මැදිහත්වීම ප්‍රමාණවත් නොවූ බවට චෝදනා නැගිණ. ඒ වෙනුවෙන් සංවිධාන ගොඩනැගුණේය. රටවල් අතර කරන යුද්ධයක් පාලනය වන සම්ප්‍රදායටට වඩා රටක් තුළ සිදුවන සිවිල් යුද්ධය කෙරෙහි ජගත් ප්‍රජාව ගේ ආකල්ප නීති රීති එකිනෙකට වෙනස්ය. එය ගැඹුරුය. එවැනි පරිවර්තන ලෝකයේ විසිරුණ මත සහිත සමාජය වෙනස් කරමින් සිටී.

ලෝකය සාධාරණ නැත. එය පිළිගත යුතුය. කුඩා රටකට එහි බලපෑම වැඩිය. බලවත් රටවල් සිතන්නේ තමන් හැමවිටම සාධාරණව ක්‍රියාකරන බවය. තමන්ට අනුව කුඩා රටවල් පවත්වා ගැනීමට හැකිනම් ලෝකයේ ප්‍රශ්න අඩු බව ඔවුහු සිතති. තමන්ට රිසි පරිදි මට්ටුකරමින් ලෝකයේ ස්වභාවය පවත්වාගෙන යන්නට බලවත් ජාතීන්ට අවශ්‍යය. ඒ වෙනුවෙන් ණය, ආධාර, උපදේශක සේවාවල සිට ඔත්තු සේවා දක්වා ජාල ක්‍රියාත්මකය. ඒවා සූක්ෂම අවස්ථා බව තේරුම් ගැනීම වටී. බලවත් රටවලට රිසි පරිදි ලෝකය පවත්වාගෙන යා හැකිනම් ජාත්‍යන්තරයේ ප්‍රශ්න වෙනස් විය හැකි නමුත් සාමකාමී ලෝකයක් මැවෙන්නේ නැත. එසේ වෙනවා නම් එක්සත් ජාතීන්ගේ සංවිධානය අවශ්‍ය නැත. එම සංවිධානය බිහිවූයේ සෙසු රටවල් බලවත් ජාතීන්ගේ බලපෑම් වලින් බේරාගැනීමේ අදහසිනි. බලවත් රටවලට නිශේ්ධ බලය තිබේ. මහ ලේකම් ධුරයට බලවත් නොවන රටකින් පත්වන්නේ පොදු අරමුණ ආරක්ෂා කර ගැනීමටය. ලෝක බලතුලනයේ සමබරතාවය ආරක්ෂා කරගැනීමටය. මානව හිමිකම් සමු`ථව සාකච්ඡුා මණ්ඩපයකි. ජයග්‍රාහකයන් හෝ පරාජිතයන් නිගමනය නොවේ. පීඩනයක් ඇතිවිට රටක ප්‍රශ්න සාකච්ඡුා කර එක`ගතා ඇතිකරගත හැකිය. අමෙරිකාව පවා මුලින් මෙම මානව හිමිකම් සැසිවාර වලට සහභාගීවීමේ සාමාජිකත්වය ගත්තේ නැත. ඔබාමා ජනාධිපතිවරයා එයට සහභාගී වන තීරණය ගත්තේ එයින් තම රටට අවස්ථාව උදා කරගැනීමේ අදහසින්ය. මානව හිමිකම් සමු`ථවේදී තීරණයකට එළැඹිය නොහැකිවුවහොත් ආරක්ෂක මණ්ඩලයට යොමුවීමේ අවදානමක් ඇති බව අවබෝධකරගත යුතුය. ප්‍රශ්න ඉදිරියේ හැ`ගීම්බරවීම අනවශ්‍ය. ජගත් ප්‍රජාව දිනා ගන්නට උපාය හා දුරදක්නා ක්‍රියාපටිපාටි අපට අවශ්‍යය. අවශ්‍ය දේ ඇ`ගට ගෙන, අනවශ්‍ය දේ නොසලකා හරින්නට අවශ්‍ය ප්‍රායෝගික ඥානය වැදගත්වන්නේ අභියෝග දිනාගැනීමෙන් පසු රට එක්සේසත් කරන තීරණාත්මක අවස්ථාවක බව අමතක කළයුතු නැත.

ශ්‍රී ලංකාව අලූත් යුගයක් කරා අවතීර්ණ වෙමින් පවතින අවස්ථාවේ බටහිර හෝ වෙනත් සමාජයක බාධාකිරීමක් සිදුවන බව පෙනෙන්නේ නම් එයට එරෙහිව මතයක් ගොඩනැගීම අවශ්‍යය. නමුත් එයට කළින් එවැනි බාධාකිරීමකට හේතුවූ කරුණු සොයාබැලිය යුතුය. ඕනෑම මිතුරෙකු හෝ සතුරෙකු සමග සෘජු ගනුදෙනුවක් සිදුනොවන අවස්ථාවලදී එහි වාසිය අත් කරගන්නේ දෙපැත්තට පණිවුඩ ගෙනයන අතරමැදියන් බව අවබෝධකර ගැනීම වැදගත්ය. මහින්ද රාජපක්ෂ මහතා ඉන්දියාව මිතුරු කරගත්තේය. අමෙරිකාව සමග ආරක්ෂක සේවා ගිවිසුමක් අත්සන් කළේය. ඉන්දියාව සමග සම්බන්ධතා පවත්වන අතර චීනය සමග සම්බන්ධකම් වැඩිදියුණු කරගත්තේය. ඉරානය සමග ආර්ථික සබ`දතා තර කළේය. මැදපෙරදිග රටවල් සමග සුහද වන අතර තුර ඊශ්‍රායලය කිට්ටු කරගත්තේය. අවශ්‍යතාවය එයයි. එහෙත් යුධ කාලපරිච්ෙඡ්දයේ තිබුණ එකී හැකියාව දැන් තවත් ශක්තිමත්ව ඉදිරියට ගෙනයා යුතුය. නව ප්‍රවේශයකට ගමන් කිරීම උදෙසා භාවිතා කළ හැකි නව අදහස් අවශ්‍යය. ජගත් ප්‍රජාව සමග අලූත් සංවාදයක්, ප්‍රතිපත්ති මත මෙහෙයැවෙන ගමනක් ආරම්භ කළහොත් වැඩි කල්

ගතවන්නට පෙර ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන වත්මන් මුහුණුවර සහමුලින් ම වෙනස් කළ හැකිය.